## වාරිමාර්ග අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව

## දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA)

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි

**උපදේශන සේවාව : ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා සිවිල් / වාස්තු විද්‍යාත්මක කාර්යයන්ට සහ ඉදිකිරීම් අධීක්ෂණයට අදාළ ගොඩනැගිලි නවීකරණය කිරීමේ වැඩ සැළසුම් කිරීම**

**යොමු අංකය : SLMOI/CRES/DOM/CS/QCBS/97**

| | | |
|---|---|---|
| රට | : | ශ්‍රී ලංකාව |
| ණය අංකය / ප්‍රදාන අංකය | : | IBRD-89960 |

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (IBRD – ලෝක බැංකුව) වෙතින් ශ්‍රී ලංකාවේ වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශයෙහි පිරිවැය සපුරා ගැනීමට මුදල් ලැබී ඇති අතර, එහි ලැබීම් වලින් කොටසක්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව, නවීකරණය සහ නව ඉදිකිරීම් සඳහා දැනට පවතින ගොඩනැගිලි පරීක්ෂාව, සැලසුම් සහ නිර්මාණ සකස් කිරීම හා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ ලංසුකරණ ලිපිලේඛන සකස් කිරීම සහ එසේම තෝරාගත් ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි සඳහා පාවිච්චියට ගත නොහැකි පවත්නා ගොඩනැගිලි කඩා ඉවත් කර එම ස්ථානවල නව ගොඩනැගිලි ඉදිකිරීම ඇතුළත්වේ.

02. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, CResMPA හි සහාය යටතේ යටිතල පහසුකම් ඇතුළුව ඔවුන්ගේ කාලගුණ පද්ධතීන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ගොඩනැගිලි අලුත්වැඩියාව, නවීකරණය සහ නව ඉදිකිරීම් සිදු කරයි.

03. අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් CResMPA වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ වාස්තු විද්‍යාත්මක / සිවිල් කර්මාන්ත උපදේශන සමාගම් වෙතින් ඉහත සඳහන් පැවරුම භාරගැනීම සඳහා තම අභිලාෂය ප්‍රකාශ කරන ලෙස ආරාධනා කරනු ලැබේ.

04. මෙම උපදේශන සේවාව අදියර දෙකකින් සමන්විත වේ.

**අදියර 1 :** ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල විස්සක (20) ගොඩනැගිලි නවීකරණය කිරීම් / නව ඉදිකිරීම් කර්මාන්ත වල සිවිල් / වාස්තු විද්‍යාත්මක වැඩ සඳහා ඉදිකිරීම් සැලැසුම් කිරීම, සැකැසීම, ප්‍රමාණ පත්‍ර (BOQ) ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තු පිළියෙළ කිරීම, ටෙන්ඩර් ලිපිලේඛන සකස් කිරීම සහ පාරිසරික හා සමාජ බලපෑම් අවම කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පිළියම් ඇතුලුව කොන්ත්‍රාත්කරුට අදළ සියලුම කාර්යයන් ඇතුළත් වන සේ අවශ්‍ය ටෙන්ඩර් පත්‍රිකා සැකසීම හා ලංසුකරණය පහසු කරවීම.

**අදියර 2 :** ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල වල (20) ඉදිකිරීම් කාලය පුරාවටම ඉංජිනේරුවරයාගේ නියෝජිත ලෙස සේව්‍යයාගේ / ඉංජිනේරුවරයාගේ වගකීම් යටතේ ප්‍රකාශිත ඉදිකිරීම් අධීක්ෂණයෙහි නියැලීම, මෙයට ක්‍රමවේද නිවේදනය, ඉදිකිරීම් අධීක්ෂණය, අතුරු කාල / අවසාන කොන්ත්‍රාත් ගෙවීම්, QA/QC අංග තහවුරු කරලීම, එකඟවූ වැඩ සැලසුමට ප්‍රතිපක්ෂව ප්‍රගතිය සමාලෝචනය කිරීම, සේවාදායක වෙත ප්‍රගතිය වාර්තා කිරීම, ඉදිකිරීම් නිම කළ වැඩ භාරගැනීමේ ක්‍රියාදාමයට සහාය වීම යනාදිය

05. පැවරුම සඳහා වන සවිස්තරාත්මක යොමු කිරීමේ අනුදේශ (TOR) සහ අභිලාෂය ප්‍රකාශ කිරීමේ (EOI) ආකෘතිය pdcresmpa@gmail.com මගින් ලබාගත හැකිය.

06. අභිලාෂී උපදේශකයින්, මෙම පැවරුම භාර ගැනීම සඳහා අදළ පළපුරුද්ද හා අවශ්‍ය සුදුසුකම් (අදියර 01 හා 02) තමන් සතු බව තහවුරු කෙරෙන තොරතුරු ලබා දිය යුතුය.

07. කෙටි ලැයිස්තු ගත කිරීමේ නිර්ණායකයන් පහත සඳහන් පරිදිවේ.

අ. සමාගම් රෙජිස්ට්‍රාර් වරයා යටතේ උපදේශන සමාගමක් ලෙස ලියාපදිංචිය සහ සංස්ථාගත කළ දිනය.

ආ. යොමු කිරීමේ අනුදේශයන්හි විස්තර කොට ඇති පරිදි පැවරුම ඉටුකිරීම සඳහා සහාය සේවා සහ උපදේශකයින් පාලනය කිරීමට සමාගම සතු ධාරිතාවය.

ඇ. සිවිල් / වාස්තු විද්‍යාත්මක කර්මාන්ත සැලැසුම් කිරීම, ඉදිකිරීම් සැලසුම් පිළියෙල කිරීම, ප්‍රමාණපත්, ඉංජිනේරු ඇස්තමේන්තු හා ලංසුකරණ ලිපිලේඛන පිළියෙල කිරීම පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

ඈ. අවම වශයෙන් පසුගිය වසර දහය (10) තුළ රු. මිලියන 300.0 ඉක්මවන ව්‍යාපෘති පහක ඉංජිනේරුවරයාගේ නියෝජිත ලෙස ඉදිකිරීම් අධීක්ෂණය කිරීම පිළිබඳ පළපුරුද්ද.

ඉ. මෙහි සඳහන් කාර්යයන්ට සමාන ස්වභාවයේ පැවරුම් පිළිබඳ විශේෂිත වූ මෑත කාලීන පළපුරුද්ද, සේවාදායකගේ නම, ස්ථානය, ක්‍රියාත්මක කිරීමේ කාලය සහ කොන්ත්‍රාත් අගය ඇතුළත් පැවරුම පිළිබඳ ලුහුඬු විස්තරයක් සහිතව පසුගිය වසර හය (6) සම්පූර්ණ කළ ආශ්‍රිත කොන්ත්‍රාත් ලැයිස්තුව.

ඊ. සම්පූර්ණ කළ පැවරුම් සඳහා පෙර සේවාදායකයින්ගෙන් ලද නිර්දේශ. (ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)

එ. **මූල්‍යමය ස්ථාවරත්වය** : පසුගිය වසර තුන (03) සඳහා විගණිත මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම මගින්, ස්ථාවර මූල්‍ය තත්ත්වයක් හා ධාරිතාවය තමන් සතු බව උපදේශක විසින් තහවුරු කළ යුතුය.

ඒ. අවශ්‍ය තොරතුරුවලට අමතරව, උපදේශකයින් විසින් මෙම පැවරුමට අදළ වියහැකි ප්‍රචාරක පත්‍රිකා හා වෙනත් අදළ ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.

08. උපදේශකයින්ට තම සුදුසුකම් හවුල් ව්‍යාපාර / සංගම් මගින් තීව්‍ර කරලීමට අවසරය ඇත.

09. **"IFB ණයකරුවන් සඳහා වන ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසි හතරවන මුද්‍රණය 2020"** හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් උපදේශකයින් තෝරා ගනු ලබන අතර, තෝරා ගැනීමේ ක්‍රමවේදය තත්ත්ව හා පිරිවැය පාදක තේරීම් (QCBS) ක්‍රමය වේ.

10. අභිලාෂී සමාගම්, ඉහත ඉල්ලා ඇති පරිදි අවශ්‍ය විස්තර / තොරතුරු මුල් පිටපත් 01 ක් හා පිටපත් 05 ක් සහිතව, EOI ඉදිරිපත් කිරීමේ ආකෘතිය පරිදි තම අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) සමග කෙටි ලැයිස්තු ගත කිරීම සඳහා ලබා දිය යුතුය.

11. වැඩිදුර තොරතුරු සෙනසුරාද, ඉරිද හා ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හැර කාර්යාල වේලාවන් – එනම් – 9.00 පැය සිට 16.00 පැය දක්වා පහත සඳහන් ලිපිනයේදී ලබාගත හැකිය.

12. **"අභිලාෂය ප්‍රකාශ කිරීම්"** ලිඛිත ආකාරයෙන් 2024 අප්‍රේල් 25 දින 13.00 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට පෞද්ගලිකව පැමිණ භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ - දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර ප්‍රවේශය,**
**නො. 11, ජාවත්ත පාර, කොළඹ - 05.**
**දුරකථනය : 0112058452**
**ෆැක්ස් : 0112058451**
**ඊමේල් : pdcresmpa@gmail.com**
**2024.04.04**